සියලුම හිමිකම් ඇවිරිණි/ KOg; gjpg;GupikAilaJ / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
kj;jpa khfhz fy;tpj; jpizf;fsk;
Department of Education Central Province

11 ශ්‍රේණිය | අ.පො.ස (සාමාන්‍ය පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2018 | 60 S I

# ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I

කාලය පැය එකයි

**සැලකිය යුතුයි:**

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුල (✗) ලකුණ යොදන්න.
- එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා ඒවාද පිළිපදින්න.

- පහත සිද්ධිය ඇසුරින් ප්‍රශ්න අංක 1 සිට 3 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

පරිසර අලංකරණයට ඉතාමත් කැමැත්තක් දක්වන කාවින්දි ප්‍රදේශයෙන් සපයාගත් විවිධ පැළවර්ග දර්ශනිය ආකාරයට සකස් කරමින් "සෞභාග්‍යා විස්තුරු පැළ" නමින් වෙළඳසැලක් ආරම්භ කරන ලදි. ප්‍රධාන මාර්ගය යාබදවීම නිසා විවිධ ගණුදෙනු කරුවන්ගෙන් මල්පැල හා තණකොළ වර්ග සඳහා ඉහල ඉල්ලුමක් ඇත.

01. කාවින්දිගේ ව්‍යාපාරය මගින් සපයන ලබන මූලික මිනිස් අවශ්‍යතාවය කුමක්ද?
1. ආහාර 2. නිවාස 3. විනෝදය 4. සෞඛ්‍යය

02. ඉහත සිද්ධියේ සඳහන් මෙම ව්‍යාපාරයට බලපෑ හැකි තර්ජනයක් **නොවනුයේ,**
1. සේවකයන් මල්පැල සොරාගැනීම
2. අධික වැසි ලැබීම
3. නව මල්පැල අලෙවි වෙළඳසැලක් ආසන්නයේ ඇරඹීම
4. කෘතිම මල් මිලට ගැනීමට ප්‍රජාව නැඹුරුවීම.

03. නිෂ්පාදන සාධක අතුරින් මල්පැල අයත් වනුයේ,
1. භූමිය 2. ශ්‍රමය 3. ප්‍රාග්ධනය 4. ව්‍යවසාය

04. ව්‍යාපාරිකයන්ට සිය අභිමතය පරිදි ව්‍යාපාර කටයුතු කිරීමේ හැකියාව සීමාකිරීම තුලින් පාරිභෝගිකයා හා දේශීය නිෂ්පාදකයන් ආරක්ෂා කිරීම සඳහා ක්‍රියාත්මක වන ව්‍යාපාර පරිසරය වනුයේ,
1. දේශපාලන පරිසරය 2. ආර්ථික පරිසරය 3. ගෝලීය පරිසරය 4. නෛතික පරිසරය

05. ව්‍යාපාරිකයන් නිපදවන භාණ්ඩ හා සේවාප්‍රමාණය, මූල්‍යශක්තිය, නිෂ්පාදනයට අදාල වෙළඳපල කොටස, කුසලතා හා පළපුරුද්ද යන සාධක අදාළ වන්නේ,
1. ස්වභාවය අනුව ව්‍යාපාර වර්ග කිරීමේදී 2. අරමුණ අනුව ව්‍යාපාර වර්ග කිරීමේදී
3. හිමිකාරීත්ව මත ව්‍යාපාර වර්ග කිරීමේදී 4. පරිමාණය අනුව ව්‍යාපාර වර්ග කිරීමේදී

06. අෂාන් ඉමල්ෂ තමා ආරම්භ කිරීමට අපේක්ෂිත ව්‍යාපාරය "ෂාන් පොත් වෙළඳසැල" නමින් ලියාපදිංචි කිරීමට අදහස් කරයි. මේ සඳහා ලියාපදිංචි සහතිකය නිකුත් කරනුයේ,
1. පළාත් සභාවයි 2. ප්‍රාදේශිය සභාවයි
3. ප්‍රාදේශිය ලේකම් කාර්යාලයයි 4. සමාගම් රෙජිස්ටාර් කාර්යාලයයි

ව්‍යාපාර සංවිධාන කෙරෙහි බලපාන පනත් කීපයක් පහත දක්වේ.
A - 2007 අංක 7 දරන සමාගම් පනත
B - 1890 හවුල් ආඥා පනත
C - 1972 අංක 5 දරන සමුපකාර සමිති පනත
D - 1840 වංචා වැලැක්වීමේ පනත

07. මින් හවුල් ව්‍යාපාර කෙරෙහි බලපාන පනත් වනුයේ,
1. A පමණි 2. B පමණි 3. A, B හා C පමණි 4. A, B හා D පමණි

08. රාජ්‍ය දෙපාර්තමේන්තු පිළිබඳ නිවැරදි ප්‍රකාශය වන්නේ,
1. විශේෂ පනතක් හෝ පොදුපනතක් යටතේ ආරම්භ කළහැකිවීම.
2. ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් පැවතීම.
3. නීතිමය කටයුතු වලදී දෙපාර්තමේන්තු ප්‍රධානියා සිය නිලනාමයෙන් පෙනී සිටිය යුතුවීම.
4. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අභිමතය පරිදි පාලන කටයුතු කලහැකිවීම.

09. පාසල් ශිෂ්‍යයෙකු තම අවශ්‍යතාවය සඳහා පොත් 10 ක් පාසැල් සමුපකාරයෙන් ලබාගැනීම ..①.. වන අතර, තිරිඟුපිටි, ඉන්ධන, සුවඳවිලවුන් විදේශ රටවලින් මිලට ගැනීම ..②.. නම්වේ.
ඉහත ① හා ② හිස්තැනට අදාළ පිළිතුර නිවැරදිව දැක්වෙනුයේ,
1. තොග වෙළදාම, අපනයන වෙළදාම
2. තොග වෙළදාම, ආනයන වෙළදාම
3. සිල්ලර වෙළදාම, අපනයන වෙළදාම
4. සිල්ලර වෙළදාම, ආනයන වෙළදාම

10. පහත දැක්වෙන්නේ ඉතිරිකිරීමේ ගිණුමක හා ජංගම ගිණුමක ප්‍රයෝජන කීපයකි.
A - තැන්පතු සඳහා පොලී ආදායම හිමිවීම
B - අයිරා පහසුකම් ලබාගත හැකිවීම
C - ස්ථාවර නියෝග නිකුත්කළ හැකිවීම
D - චෙක්පත් මගින් ගනුදෙණු කළ හැකිවීම
E - හරපත් මගින් ගනුදෙනු කළ හැකිවීම

ඉහත සඳහන් කරුණු අතරින් ඉතිරිකිරීමේ ගිණුම්වල ප්‍රයෝජන ඇතුලත් පිළිතුර වන්නේ,
1. A, B, E  2. A, C, D  3. A, C, E  4. A, D, E

11. රාජපක්ෂ මහතා තමාට වැළදී ඇති හෘදරෝගය පිළිබඳව වසංකරමින් ජීවිත රක්‍ෂණ ආවරණයක් ශ්‍රී ලංකා රක්‍ෂණ සංස්ථාවෙන් ලබාගෙන ඇත. ඔහු තම බිරිඳ වෙනුවෙන් තවත් ජීවිත රක්‍ෂණ ආවරණයක් සීමාසහිත සෙලින්කෝ රක්‍ෂණ සමාගමින් ලබාගෙන ඇත.
ඉහත සිද්ධියට අදාළ නිවැරදි වගන්තිය ඇතුළත් පිළිතුර වන්නේ,
1. හෘදරෝගය නිසා සිදුවන අනතුරු සඳහා හානිපූර්ණය කළහැකි අතර බිරිඳ වෙනුවෙන් රක්‍ෂණයක් ලබාගැනීමට රක්‍ෂ හිමිකමක් ඇත.
2. හෘදරෝගය වසංකිරීම උපරිම විශ්වාසය කඩකිරීමක් වන අතර බිරිඳ, නමින් ඔහුට රක්‍ෂණ ගිවිසුමකට එළඹිය නොහැක.
3. හෘදරෝගය වසංකිරීම නිසා උපරිම විශ්වාසය කඩවීම හා බිරිදගේ ජීවිතය රක්‍ෂණය කිරීමට රක්‍ෂහිමිකම ඇත.
4. ඔහුට තම ජීවිතය හා බිරිදගේ ජීවිතය රක්‍ෂණ සමාගම් දෙකක රක්‍ෂණය කළ නොහැක.

12. ප්‍රවාහනය සම්බන්ධයෙන් පහත ප්‍රකාශ අතුරින් එකඟවිය **නොහැකි** ප්‍රකාශය වන්නේ,
1. විශාල වශයෙන් මගීන් හා භාණ්ඩ ප්‍රමාණයක් එකවර ප්‍රවාහනය කලහැකිවීම ජල පරිවහනයේ වාසියකි.
2. ව්‍යාපාර කටයුතු කාර්යක්‍ෂම කිරීම සඳහා ප්‍රවාහනය දායක වේ.
3. ප්‍රවාහන වියදම් ඉහලයාම භාණ්ඩ මිල ඉහලයාමට හේතුවේ.
4. බොහෝවිට ගමනාන්තය දක්වාම ප්‍රවාහනය කල හැකිවිට දුම්රිය ප්‍රවාහනයේ වාසියකි.

13. ජපානයේ රැකියාවක් කරන රැසිරු සේනාරත්නට හදිසියේම ඔහුගේ උප්පැන්න සහතිකය හා විභාහ සහතිකයේ මුල්පිටපත් අවශ්‍ය වී ඇත. ඒවා යැවීම සඳහා වඩාත් සුදුසු ක්‍රමය වන්නේ,
1. ෆැක්ස් මගින්
2. විද්‍යුත් තැපැල මගින්
3. සාමාන්‍ය තැපැල
4. කුරියර් සේවය

14. ඕනෑම කටයුත්තක් කිරීමට පෙර එය සිදුවියයුතු ආකාරය පිළිබඳව සිතාබලා අවශ්‍ය ආකාරයට කටයුතු කිරීම,
1. කලමනාකරණයයි
2. සංවිධානයයි
3. මෙහෙයවීමයි
4. සැලසුම්කරණයයි

15. පෞද්ගලික අධ්‍යාපන ආයතනයක් ප්‍රධාන පාසලක වාණිජදිනයට අනුග්‍රාහක දායකත්වය ලබාදෙන ලදී. මෙම සමාගම මෙසේ මුදල් වියදම් කරනු ලැබුවේ අලෙවි මිශ්‍රයේ කුමන විචල්‍ය වෙනුවෙන්ද?
1. නිෂ්පාදිතය වෙනුවෙනි
2. මිල වෙනුවෙනි
3. ස්ථානය වෙනුවෙනි
4. ප්‍රවර්ධනය වෙනුවෙනි

16. සීමාසහිත රණමයුර සමාගමේ කොටස් 200 ක් එකක් රුපි 100/- බැගින් මිලදී ගත් අංජලි එම කොටස් සියල්ල එකක් රුපි. 105/- බැගින් විකුනා රුපි. 1000/- අමතර මුදලක් ලැබීය. එම මුදල හඳුන්වන්නේ,
1. ලාභාංශ ලෙසය
2. ප්‍රග්ධන ලාභ ලෙසය
3. ප්‍රතිලාභ ලෙසය
4. පොළී ආදායම ලෙසය

17. පහත දී ඇති ගනුදෙනු අතරින් වගකීමක් අඩුකරන ගනුදෙනුව වන්නේ,
1. රු. 50,000/- බැකු ණයක් ලබාගැනීම.
2. රු. 15,000/- බඩුතොගය කවිෂාන්ගෙන් ණයට ගැනීම.
3. රු. 8,000/- මුදලක් චන්නට ගෙවීම.
4. රු. 4,000/- විදුලිබිලක් මුදලින් ගෙවීම

18. 2018.01.01 ව්‍යාපරයක තිබූ වත්කම්, වගකීම් හා හිමිකම් ශේෂ පහත දැක්වේ.

| | |
|---|---|
| වත්කම් | 240,000.00 |
| හිමිකම් | 175,000.00 |
| වගකීම් | 65,000.00 |

පහත ගනුදෙනුව සිදුවූ පසු ගිණුම්කරන සමීකරණය වන්නේ,
රු. 50,000/- බඩුතොගයක් ණයට ගැනීම

| | වත්කම් | = | හිමිකම් | + | වගකිම් |
|---|---|---|---|---|---|
| 1. | 240,000 | = | 175,000 | + | 65,000 |
| 2. | 290,000 | = | 175,000 | + | 115,000 |
| 3. | 240,000 | = | 125,000 | + | 115,000 |
| 4. | 190,000 | = | 175,000 | + | 15,000 |

19. ව්‍යාපාරයක් රු. 25,000/- බඩුතොගයක් ණයට විකුණූ අතර අයිතිකරු රු. 4,000/- භාණ්ඩ තොගයක් පෞද්ගලික ප්‍රයෝජනයට රැගෙන යන ලදී. මෙහි පළමු ගණුදෙනුවේ මූලාශ්‍ර ලේඛනය ......①... වන අතර දෙවන ගනුදෙනුව සටහන් කරන මූලිකපොත ......②... වේ.
ඉහත ① හා ② ස්ථාන සඳහා නිවැරදි පිළිතුරු පිළිවෙළින් දක්වෙන්නේ,
1. ලදුපත, මුදල්පොත
2. ගැනුම් ඉන්වොයිසිය, මුදල්පොත
3. විකුණුම් ඉන්වොයිසිය, පොදුජනලය
4. ලදුපත, පොදුජ'නලය

20. පහත දැක්වෙන්නේ ලෙජරයේ ඇති ගිනුම්වර්ග කීපයකි.
A - ලැබුවට්ටම් ගිණුම   B - ගෙනයාමේ කුලි ගිණුම
C - ගැනිලි ගිණුම   D - උපකරණ ගිණුම
මින් වැඩිවීම "හර" අඩුවීම "බැර" යන ද්විත්ව සටහන් මූලධර්මය නිරූපනය වන ගිණුම් වන්නේ,
1. A හා B   2. B හා D   3. A හා C   4. B, C හා D

21. තැන්පත් කරන ලද චෙක්පතක් අගරු වූවිට ව්‍යාපාරය තැබිය යුතු ද්විත්ව සටහන වන්නේ,
1. ණයගැති ගිණුම (හර)
   බැංකු ගිණුම (බැර)
2. ණයහිමි ගිණුම (හර)
   බැංකු ගිණුම (බැර)
3. බැංකු ගිණුම (හර)
   ණයගැති ගිණුම (බැර)
4. මුදල් ගිණුම (හර)
   බැංකු ගිණුම (බැර)

22. කල්පනීගේ ව්‍යාපාරය රු. 60,000/- බඩුතොගයක් රශ්මිගෙන් ණයටගත් අතර කල්පනී මෙම ණය මුදල පියවීමේදී රශ්මිගෙන් 4% වට්ටමක් හිමිවිය. මෙම ගනුදෙනුවට අදාළ නිවැරදි පිළිතුර වන්නේ,
1. කල්පනීගේ ව්‍යාපාරයේ දුන්වට්ටම රු. 2400/- න් වැඩිවේ.
2. කල්පනීගේ ව්‍යාපාරයේ ලදවට්ටම රු. 2400/- න් වැඩිවේ.
3. වට්ටම රු. 2400/- පොත්වල සටහන් නොකරයි.
4. රශ්මිගේ ව්‍යාපාරයේ ලැබුවට්ටම රු. 2400/- න් වැඩිවේ.

23. ව්‍යාපාරයක සුළුමුදල් අග්‍රිමය රු. 4000/- කි. 2018.01.31 අතඉතිරි මුදල 1800/- කි. පෙබරවාරි මාසයේ සුළුමුදල් වවුචර් පහත පරිදිවිය.

| | | |
|---|---|---|
| පෙබ. 03 | ගමන්වියදම් | 400/- |
| පෙබ. 11 | ලිපිද්‍රව්‍ය | 380/- |
| පෙබ. 13 | තැපැල් වියදම් | 160/- |
| පෙබ. 17 | මයුරට ගෙව්වා | 600/- |
| පෙබ. 21 | සංග්‍රහ වියදම් | 900/- |

2018 මාර්තු 01 දිනට ප්‍රතිපූර්ණය කල යුතු මුදල කොපමණද?
1. රු. 1200/-   2. රු. 1560/-   3. රු. 2440/-   4. රු. 4000/-

24. ව්‍යාපාරයක සිදුවී ඇති ගනුදෙනුවලින් පොදුජනලයේ වාර්තා කලයුතු ගනුදෙනුව කුමක්ද?
1. ව්‍යාපාරයේ ප්‍රයෝජනය සඳහා රු. 25,000/- ගෙවා ලබාගත් මෝටර්රථය
2. මෝටර්රථය රු. 5000/- ක්ෂයවීම
3. ණයගැතියන්ගෙන් මුදල් ලැබීමේදී දුන්වට්ටම රු. 400/-
4. ගෙවියයුතුව තිබූ විදුලිබිල රු. 700/- ගෙවීම.

25. ව්‍යාපාරයක් පිළියෙල කල ශේෂපිරික්ෂසුමේ හර එකතුව, බැර එකතුවට වඩා රු. 2700/- ක් වැඩිවිය. එම වෙනස ඇතිවීමට බලපෑ හැකියයි සිතිය හැකි ගනුදෙනුව වන්නේ,
1. ලිපිද්‍රව්‍ය ගිණුමේ එකතුව රු. 2700/- ක් අඩුවෙන් සටහන්ව තිබීම.
2. ලදවට්ටම් ගිණුමේ සටහන් කලයුතු රු. 1350/- දුන්වට්ටම් ගිණුමේ සටහන්ව තිබීම.
3. විදුලි වියදම් රු. 5400/- දුරකතන ගිණුමේ රු. 2700/- ලෙස සටහන්ව තිබිය.
4. වේතන ගිණුමේ සටහන් කලයුතු රු. 6300/- සටහන්ව ඇත්තේ රු. 3600/- ලෙසය.

26. පහත දැක්වෙන්නේ ගිණුම්කරණයේ සිදුවූ වරදක් නිවැරදි කිරීමට අදාළ පොදුජානලයෙන් උපටාගත් සටහනකි.

අවිනිශ්චිත ගිණුම (හර) 12000/-
ණයගැනි ගිණුම (බැර) 12000/-

ව්‍යාපාරයේ ගිණුම්පොත්වල සිදුවී තිබූ වරද වන්නේ,
1. ණයගැති ගිණුමේ සටහන්ව නොතිබූ රු. 12000/- ණයට විකුණුම් සටහන් කිරීම.
2. ණයගැතියෙකුගෙන් ලද රු. 12000/- ණයගැති ගිණුමේ හරට සටහන්ව තිබීම.
3. ණයගැතියෙකුගෙන් ලද රු. 6000/- මුදල්පොතට හා ණයගැති ගිණුමට හරකර තිබීම.
4. ණටගැතියෙකුගෙන් ලද රු. 12000/- මුදල ණයගැති ගිණුමට රු. 1200/- ලෙස සටහන්ව තිබීම.

27. ව්‍යාපාරයක 2018.10.31 දිනට බැංකුගිණුමේ ශේෂය රු. 28200/- ක් වූ අතර එදිනට බැංකු ප්‍රකාශයට අනුව ශේෂය රු. 32500/- විය. මෙම වෙනසට හේතුවූ ගනුදෙනුව කුමක්ද?
1. බැංකුව අයකල බැංකු ගාස්තු රු. 4300/-
2 තැන්පත්කල නිශ්කාශනය නොවූවෙක් රු. 4300/-
3. බැංකුවට ලැබී ඇති සෘජුප්‍රේෂණ රු. 4300/-
4. ස්ථාවර නියෝගමත අයකරගත් රක්‍ෂණ වාරිකය රු. 4300/-

28. ජංගම දුරකථන බැංකුකරණය ආශ්‍රිතව නිවැරදි වගන්තිය වන්නේ,
1. ගිණුමකින් ගිණුමකට මුදල් මාරුකල නොහැකිවීම.
2. මුල්‍යමය ගනුදෙනු ඉතාඉක්මනින් සපුරාගත හැකිවීම
3. කාලීන දත්ත පහසුවෙන් ලබාගත හැකිවිම.
4. දත්ත ලබාගැනීමේ හා වෙනස්කිරීමේ අවදානමක් තිබීම

29. ව්‍යාපරයක මුල්‍යතත්ව ප්‍රකාශයක ඇතුලත් මූලිකාංග වන්නේ,
1. වත්කම්, හිමිකම්, වගකිම්
2. වත්කම්, ජංගම නොවන වත්කම්, වගකිම්
3. හිමිකම්, ආදායම්, වගකිම්
4. ජංගම වගකිම්, හිමිකම්, ශුද්ධලාභය

30. ව්‍යාපාරයක් කාර්තුවකට වරිපනම් බදු රු. 3000/- ක් ගෙවන අතර කුලියට දුන් ගොඩනැගිල්ල සඳහා මාසිකව රු. 10000/- ලබයි. 2017.12.31 න් අවසන් වර්ෂයේ වරිපනම් බදු ගෙවා ඇත්තේ රු. 9000/- ක් වන අතර ගොඩනැගිලි කුලී ආදායම ලැබී ඇත්තේ රු. 100,000/- පමණි. ව්‍යාපාරයේ අදාළ ගැලපීම් වලින් පසු මුල්‍ය තත්ව ප්‍රකාශයේ උධෘතය වන්නේ,
1. ජංගම වගකිම් - උපචිත වරිපනම් බදු 3000/-
ජංගම වත්කම් - උපචිත කුලී ආදායම 20000/-
2. ජංගම වගකිම් - උපචිත වරිපනම් බදු 9000/-
ජංගම වත්කම් - උපචිත කුලී ආදායම 100,000/-
3. ජංගම වගකිම් - උපචිත කුලී ආදායම 20000/-
ජංගම වත්කම් - උපචිත වරිපනම් බදු 3000/-
4. ජංගම වත්කම් - උපචිත කුලී ආදායම 120,000/-
ජංගම වගකිම් - උපචිත වරිපනම් බදු 12000/-

31. වෙළඳී ව්‍යාපාරයක් මිලටගත් මෝටර්රථයකට අදාළ තොරතුරු පහත දැක්වේ.

| | |
|---|---|
| මොටර්රථයේ ගැනුම්මිල | රු. 980000/- |
| නැව් ගැස්තු | රු. 40000/- |
| තීරුබදු / වරාය ගාස්තු | රු. 120000/- |
| සුන්බුන් අගය | රු. 90000/- |
| ඵලදායී ජීවකාලය වර්ෂ 10 | |

සරල මාර්ග ක්‍ෂයක්‍රමය අනුව මෝටර්රථයේ වාර්ෂික ක්‍ෂය වන්නේ,
1. රු. 89000/- 2. රු. 98000/- 3. රු. 105000/- 4. රු. 110000/-

32. 2017.01.01 දිල්හාර රු. 350000/- ගොඩනැග්ල්ලද රු. 200000/- උපකරණද රු. 150000/- මුදල්ද යොදා ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. 2017.12.31 දිනෙන් අවසන් වර්ෂයේ රු. 430000/- ආදායමක් ඉපැයූ අතර රු. 240000/- වියදමක් දරන ලදී. දිල්හාර රු. 15000/- මුදලක් පෞද්ගලික ප්‍රයෝජනයට ලබාගෙන ඇත. 2017.12.31 දිනට ව්‍යාපාරයේ හිමිකම වන්නේ,
1. රු. 190000/- 2. රු. 700000/- 3. රු. 875000/- 4. රු. 890000/-

• **පොත් මුද්‍රණ නිෂ්පාදන ව්‍යාපාරයක පහත තොරතුරු ඇසුරින් 33, 34 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

| | |
|---|---|
| කඩදාසි හා තීන්ත | රු. 180000 |
| වක්‍රද්‍රව්‍ය වියදම් | රු. 60000 |
| පොත් මුද්‍රණ සේවක වැටුප | රු. 70000 |
| කතෘ භාගය | රු. 20000 |
| කම්හල් ගොඩනැගිලි කුලී | රු. 60000 |
| කම්හල් විදුලිය | රු. 20000 |

33. ඉහත තොරතුරු වලට අනුව ව්‍යාපාරයේ ප්‍රාථමික පිරිවැය වන්නේ,
1. රු. 250000/- 2. රු. 270000/- 3. රු. 330000/- 4. රු. 410000/-

34. මෙම ව්‍යාපාරය නිෂ්පාදනය කරන ලද පොත් සංඛ්‍යාව 2000 ක් නම් පිරිවැයට 20% එකතුකොට විකුණුම්මිල තීරණය කරයි නම් පොතක පිරිවැය වන්නේ,
1. රු. 246/- 2. රු. 205/- 3. රු. 165/- 4. රු. 135/-

• **පහත තොරතුරු ඇසුරින් 35 - 40 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

පාරමීගේ වෙළඳ ව්‍යාපාරයේ 2017.12.31 දිනට පිළියෙල කළ ශේෂපිරික්ෂුම පහත දැක්වේ.

| විස්තරය | හර (රු.) | බැර (රු.) |
|---|---|---|
| ප්‍රචාරණ ගාස්තු | 12000 | |
| වරිපනම් බදු | 8000 | |
| ගැනුම් | 460000 | |
| 17.01.01 තොගය | 26000 | |
| විකුණුම් | | 625000 |
| ප්‍රග්ධනය | | 320000 |
| මුදල් ශේෂය | 28000 | |
| බැංකු අයිරාව | | 14000 |
| ණයගැතියෝ | 90000 | |
| ණයහිමියෝ | | 105000 |
| ගෙනඑමේ කුලී | 7000 | |
| විදුලිය | 12000 | |
| වෙළ, සේවක වැටුප් | 17000 | |
| මෝටර්රථය | 400000 | |
| බොල්ණය | 4000 | |
| | 1064000 | 1064000 |

අමතර තොරතුරු,

1. 2017.12.31 දිනට ඉතිරි බඩුතොගය 43000/-
2. තවත් බොල්ණය 2000/- කපාහල යුතුය
3. විදුලිබිල රු. 4000/- උපචිතව පවති
4. අයිතිකරුගේ මුදල් ගැනිලි 10000/-

35. මෙම ව්‍යාපාරයේ 2017.12.31 න් අවසන් වර්ෂයේ ලාභලාභ ප්‍රකාශයේ බෙදාහැරීමේ වියදම් වල එකතුව වන්නේ,
1. රු. 12000 2. රු. 16000 3. රු. 33000 4. රු. 35000

36. මෙම ව්‍යාපාරයේ විකුණුම් පිරිවැය වන්නේ,
1. රු. 625000 2. රු. 493000 3. රු. 460000 4. රු. 450000

37. මෙම ව්‍යාපාරයේ ජංගම වගකීම් වල එකතුව වන්නේ,
1. රු. 103000 2. රු. 105000 3. රු. 119000 4. රු. 123000

38. මෙම ව්‍යාපාරයේ ශුද්ධලාභය වන්නේ,
1. රු. 116000 2. රු. 118000 3. රු. 122000 4. රු. 440000

39. ව්‍යාපාරයේ මෝටර්රථය වාර්ෂික 10% බැගින් සරලමාර්ග ක්‍රමයට ක්ෂය කරයි නම් නිවැරදි ක්ෂය වටිනාකම සහිතව ද්විත්ව සටහන වන්නේ,
1. මෝටර්රථ ගිණුම (හර) 40000
   මොටර්රථ ක්ෂය ගිණුම (බැර) 40000
2. මොටර්රථය ක්ෂය ගිණුම (හර) 40000
   මෝටර්රථ ගිණුම (බැර) 40000
3. මොටර්රථ ක්ෂය ගිණුම (හර) 40000
   මොටර්රථ ක්ෂය වෙන්කිරීමේ ගිණුම (බැර) 40000
4. මොටර්රථ ක්ෂය වෙන් ගිණුම (හර) 40000
   මෝටර්රථ ක්ෂය ගිණුම (බැර) 40000

40. 2017.12.31 දිනට ව්‍යාපාරයේ මුළු හිමිකම වන්නේ,
1. රු. 320000 2. රු. 426000 3. රු. 436000 4. රු. 438000

සියලුම හිමිකම් ඇවිරිණි/ KOg; gjpg;GupikAilaJ / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
kj;jpa khfhz fy;tpj; jpizf;fsk;
Department of Education Central Province

11 ශ්‍රේණිය අ.පො.ස (සාමාන්‍ය පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2018 **60 S II**

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය II

**කාලය පැය දෙකයි**

**සැලකිය යුතුයි :**

- **උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**
- **පළමුවන ප්‍රශ්නය ඇතුලුව I කොටසෙන් ප්‍රශ්න දෙකක්ද II කොටසෙන් ප්‍රශ්න දෙකක්ද බැගින් තෝරාගත ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

01. පහත සිද්ධිය පදනම් කරගෙන 1 සිට 10 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

"My Boys" තරුණ සමාජයේ මූලිකත්වයෙන් ප්‍රදේශයේ දැවෙන ප්‍රශ්නයක් වන කසල බැහැර කිරීමේ ව්‍යාපෘතියක් පිළිබඳව සමාජයේ අවධානය යොමුවී ඇත.

2016 ජනවාරි 01 දින ආරම්භ කල මෙම තරුණ සමාජයේ සාමාජිකයින් ගණන 200 ක් වූ අතර එක් අයෙකුගෙන් අයකරන මාසික සාමාජික ගාස්තුව රු. 50/- විය. සාමාජිකයින් 180 දෙනෙක් වර්ෂයට අදාළ සියළු සාමාජික මුදල් ගෙවා තිබුණි. සාමාජිකයින් 20 දෙනෙක් මාස 8 මුදල් පමණක් ගෙවා තිබුණි.

මෙම තරුණ පිරිසට අවශ්‍ය වුයේ ප්‍රදේශයේ කැලිකසල බැහැර කිරීමවිධිමත් කිරීම මගින් වසංගත රෝග අවම කිරීමය. "නිකසල නගරයක් - නිරෝගී ප්‍රජාවක්" ඔවුනගේ තේමාව විය. ඔවුන් ඒ සඳහා ප්‍රදේශයේ වගකිවයුතු නිළධාරීන් හා සම්පත් දයකයින් සම්බන්ධ කරගනිමින් අළුත් වැඩ පිළිවෙලක් පිළිබඳ ව්‍යාපෘති වාර්තාව ප්‍රදේශිය සභාව මගින් මධ්‍යම පරිසර අධිකාරියටද යොමු කොට ඇත. ව්‍යාපෘතියේ අරමුන වන්නේ ඉවත්කරන කසල වර්ගීකරණය කොට කාබනික පොහොර නිපදවීමය. 2017.01.01 සමාජය සතුව අතඉතිරි මුදල රු. 80000/- විය. වෙනත් කිසිදු වත්කමක් වගකීමක් නොවිය. ඔවුන්ගේ සමාජයේ පහත ගනුදෙනු සිදුවී ඇත.

| | |
|---|---|
| පරිසර ව්‍යාපෘතියට ලිපි / බැනර් සඳහා | රු. 8,000 |
| ප්‍රවාහන ගාස්තු | රු. 12,000 |
| භූමියට ගෙවූ බදුකුලී | රු. 45,000 |
| උපකරණ මිලට ගැනුම් | රු. 140,000 |
| ජල ගාස්තු | රු. 12,000 |
| විදුලිය | රු. 29,000 |
| පරිත්‍යාග | රු. 150,000 |

බදුකුලී රු. 15000/- ගෙවිය යුතුව ඇත.

1. අ) අරමුණ අනුව මෙය කුමන ව්‍යාපාර සංවිධානයකට අයත්ද?
   ආ) එය My Boys තරුණ සමාජය නමින් ලියාපදිංචි කොට ඇත්තේ කුමන පනතක් යටතේද?
2. අ) "නිකසල නගරයක් - නීරෝගී ප්‍රජාවක්" තේමාවට අනුව කුමන මූලික මිනිස් අවශ්‍යතාවය සපුරා ගැනීමට ඔවුන් අදහස් කරයිද?
   ආ) ඊට අදාලව වුවමනාවක් නම් කරන්න.
3. අ) සිද්ධියේ සඳහන් ව්‍යාපාර සංවිධාන වර්ග දෙකක් නම් කරන්න.
   ආ) කාබනික පොහොර නිෂ්පාදන කිරීමට අදහස් කිරීම කුමන කලමණාකරන කාර්යයට අයත්වේද?
4. මෙම සංවිධානයේ ගනුදෙනු විධිමත් කිරීම සඳහා ජංගම ගිණුමක් ආරම්භ කිරීමට සාමාජිකයන් අදහස් කරයි. ජංගම ගිණුමක් ඇරබීමෙන් ලබාගත හැකි ප්‍රයෝජන දෙකක් නම් කරන්න.
5. මෙම සංවිධානයේ 2017 වර්ෂය සඳහා ලැබීම් ගෙවීම් ගිනුම පිළියෙල කොට අතඉතිරි මුදල් ශේෂය සොයන්න.
6. ලැබීම් ගෙවීම් ගිණුමක් / ආදායම් වියදම් ගිණුමක් අතර වෙනස්කම් දෙකක් සඳහන් කරන්න.
7. මෙහි සඳහන් ජංගම නොවන වත්කමක් හා ජංගම වගකීමක් වටිනාකම් සහිතව දක්වන්න.
8. 2017.12.31 න් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය පිළියෙළ කරන්න.
9. 2017 වර්ෂයේ උපකරණ මිලට ගැනීම ගිණුම් ගත කිරීමට අදාළ ද්විත්ව සටහන ලියන්න.
10. 2017.12.31 ට සමුච්චිත අරමුදල ගණනය කරන්න.

## I කොටස - ව්‍යාපාර අධ්‍යයනය

- **ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.**

02. 1. අ) පුද්ගලයෙකුට නම අවශ්‍යතා හා වුවමනා සපුරාගත හැකි ආකාර දෙකක් සඳහන් කරන්න.
ආ) භාණ්ඩ හා සේවා අතර වෙනස්කම් දෙකක් දක්වන්න.

2. පහත සඳහන් ප්‍රකාශ සත්‍යද, අසත්‍යද යන්න දක්වන්න.
අ) භාණ්ඩ හා සේවාවල ගුණත්වය ඉහළ නැංවීම ව්‍යාපාරයක උපඅරමුණකි ( )
ආ) සිල්ලර හා තොග වෙළඳ ආයතන භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාරයකට නිදසුනකි. ( )
ඉ) ව්‍යාපාර අරමුණු ඉටුකරගැනීමට අවශ්‍ය තිරණ ගැනීම හා එම තීරණ ක්‍රියාත්මක කිරීම කළමණාකරුවන්ගේ අරමුණකි ( )
ඊ) ජාත්‍යන්තර වෙළඳගිවිසුම්, වෙළඳ කලාප මගින් ජාත්‍යන්තර සබඳතා ඇතිකර ගැනීම දේශපාලන පරිසරයට අයත්වේ ( )

3. ලහිරු සුදේශ් නම ගෙවත්තේ හා අසල්වැසි වතුපිටිවලින් සපයා ගන්නා ශාකකඳන්, අතු මුල්, වැල් වලින් තම මිතුරෙකු වන දිල්ශාන් ගේද සහාය ඇතිව විවිධ විසිතුරු රූක්කලා නිර්මාණය කොට A-9 ප්‍රධාන මාර්ගයට මුහුණලා ඇති කඩකාමරයක තබා දෙස් - විදෙස් සංචාරකයන්ට අලෙවිකරයි.
අ) මෙම සිද්ධියේ සඳහන් නිෂ්පාදන සාධක දෙකක් ලියන්න.
ආ) ඔබ සඳහන් කල නිෂ්පාදන සාධක සඳහා උදාහරණය බැගින් ලියන්න.

4. චන්න ප්‍රධාන පාසැල් කීපයක් ආසන්න ස්ථානයක පාසැල් ලිපිද්‍රව්‍ය මුද්‍රිත පොත්පත් අලෙවිකිරීමේ වෙළඳසැලක් පවත්වාගෙන යයි. දෛනිකව ලිපිද්‍රව්‍ය මිලට ගැනීමට එන පාසැල් සිසුන් සංඛ්‍යාව වැඩිවෙමින් පවතී.
අ) චන්නගේ ව්‍යාපරයට ඇති අවස්ථාවක් නම් කරන්න.
ආ) මොහුගේ ව්‍යාපරයේ තිබිය හැකියයි නිගමනය කලහැකි දුර්වලතාවයක් නම් කරන්න.

(මුළු ලකුණු 08යි)

03. 1. නිපුනි දිල්හාරා ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මගින් මෙහයවන ලද සුරතල්සතුන් නිෂ්පාදන පිළිබඳ පුහුණු වැඩමු ඵවකින් අනතුරුව ඇයවිසින් නිර්මාණය කරන ලද සුරතල් සතුන් අලෙවි කිරීමේ වෙළඳසැලක් "නිපුනි සුරතල් සතුන්" නමින් ඇරඹීමට අදහස් කරයි.
අ) ඇයගේ ව්‍යාපාරය ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කලයුතු ලියවිල්ලක් නම් කරන්න.
ආ) ඇය ආරම්භකල ව්‍යාපර සංවිධානයේ වාසි දෙකක් සඳහන් කරන්න.

2. පහත සඳහන් ප්‍රකාශ සත්‍යද, අසත්‍යද යන්න දක්වන්න.
අ) හවුල් ව්‍යාපාරයක ආරම්භක ප්‍රාග්ධනය රු. 1000/- වැඩිනම් වංචා වැලැක්වීමේ ආඥාපනතට අනුව ලිඛිතව ආරම්භ කළ යුතුයි ( )
ආ) හවුල්කරුවන් සතු විවිධ දක්ෂතා ප්‍රයෝජනයට ගත හැකිවීම හවුල් ව්‍යාපාරයක වාසියක් වන අතර අසීමිත වගකීමක් තිබිම තනිව්‍යාපාරයක වාසියකි. ( )
ඉ) ස්වේච්ඡා හා විවෘත සාමාජිකත්වය සමුපකාර සමිතිවල වාසියකි. ( )
ඊ) පොල් සංවර්ධන අධිකාරිය, ජලසම්පාදන හා ජලා පවාහන මණ්ඩලය රාජ්‍ය සංස්ථා යටතට අයත්වේ. ( )

3. සෙව්මිණි ධනංජනා නුවරඑළියේ කානේෂන් මල්වගාවේ නියුතු යෙහෙළිය පුමුදිට මහනුවර ලංකා බැංකුවේ ඇති ජංගම ගිනුමෙන් රු. 50000/- චෙක්පතක් යවා මල්තොගයක් ගෙන්වා ගන්නා ලදී.
අ) මෙම සිද්ධියේ සඳහන් ආදායකයා හා අණකරු නම් කරන්න.
ආ) චෙක්පතක් පිටසන් කිරීම සිදුකරන අවස්ථා 01 ක් ලියන්න.

4. දෛනික ව්‍යාපාර කටයුතු නිමකල අශේන් ව්‍යාපාර ස්ථානයේම රාත්‍රියගත කල අතර මධ්‍යම රාත්‍රියේ ව්‍යාපාර ස්ථානයට ඇතුළුවීමට තැත්කරන සොරෙකු පිළිබඳව CCTV කැමරාව මගින් දැනගත හැකිවිය. වගාම ලඟම පොලීසියට දුරකථන ඇමතුමක් මගින් ඒ බව දැනුම් දුන්හ. පොලිසිය ඉතා ඉක්මනින් ව්‍යාපාර ස්ථානයට එන බව පැවතීය.
අ) ඉහත සිද්ධියට අනුව සන්නිවේදනයේ ප්‍රතිපෝෂණ මූලිකාංගයට අදාළ ක්‍රියාව වන්නේ,
ආ) සිද්ධියේ ඇතුළත් සන්නිවේදනයේ ස්වරූපය හා මාධ්‍යය නම් කරන්න. (මුළු ලකුණු 08යි)

04. 1. තිසර සඳපියුම් ජපානයේ වසර 5 ක රැකියාවක නිරතව සිට ලංකාවට පැමිණයේ සැලකිය යුතු මුදලක් උපයා ගැනීමෙන් අනතුරුවයි. මෙම මුදල් ඉහළ පොලියක් හා පූර්ණ රාජ්‍ය ආරක්ෂවක් ලැබෙන ආයෝජන මාර්ගයක ආයෝජනය කිරීමට අදහස් කරයි.
අ) මේ සඳහා විකල්ප ආයෝජන මාර්ග දෙකක් නම් කරන්න.
ආ) දේපල මිලට ගැනීමෙන් ලබාගත හැකි ප්‍රතිලාභ දෙකක් නම් කරන්න.

2. පහත සඳහන් ප්‍රකාශ සත්‍යද, අසත්‍යද යන්න දක්වන්න.
අ) මිනිස් අවශතා හා වුවමනා වඩාත් හොඳින් තෘප්තිමත් කලහැකි භාණ්ඩයක් හෝ සේවයක් නිර්මාණය කිරීම කළමණාකරණයයි. ( )

ආ) නිෂ්පාදිත පාරිභෝගිකයා වෙත ලබාදීම හා සම්බන්ධ කටයුතු ස්ථානය ලෙස හැඳින්විය හැකිය. (    )

ඉ) කොළඹ කොටස් වෙළඳපල කටයුතු අධීක්ෂණය කරනු ලබන්නේ ශ්‍රී ලංකා සුරකුම්පත් හා විනිමය කොමිෂන් සභාවයි. (    )

ඊ) කොටස්කරුවෙකුට සමාගමක කොටස් මිලදී ගැනීමෙන් ලැබෙන ප්‍රතිලාභය පොලියයි. (    )

3. අගනුවරට ආසන්නව කාන්තා ඇඳුම් හා සාරිහැට්ට මැසීමේ ව්‍යාපාරයක් ආශිනි රාජපක්ෂ විසින් පවත්වාගෙන යයි. ඇයවිසින් ව්‍යාපාරය ආරම්භ කිරීමට ප්‍රථම අනුගමනය කල පියවර කීපයක් පහත දැක්වේ. ඒ ඒ පියවරයන්ට අදාළ කළමණාකරන කාර්යය ලියා දක්වන්න.
   අ) ඇඳුම් මසන්නියන් සඳහා අවශ්‍ය උපදෙස් හා තොරතුරු ලබාදීම -
   ආ) නිෂ්පාදන ඇඳුම් ප්‍රමිතියට අනුකූලදැයි බැලීම -
   ඉ) ඇඳුම් මැසීමේ හැකියාව ඇති කාන්තාවන් බඳවාගැනීම -
   ඊ) නවීන මහන මැෂිමක් ගැනීමට තීරණය කිරීම -

4. විසිතුරු භාණ්ඩ අලෙවිසැලක් පවත්වාගෙන යන දහම් මහතා තම වෙළඳසැලෙන් භාණ්ඩ මිලට ගන්නා ගනුදෙනුකරුවන්ට කුමන හෝ තිළිණයක් ලබාදීමට අමතක නොකරයි.
   අ) එය අලෙවි මිශ්‍රයේ කුමන විචල්‍යයට අයත්වේද?
   ආ) චමෝද් විසින් නිෂ්පාදනය කරනු ලබන බම්මල් ගනුදෙනුකරුවන්ට අලෙවිකිරී සඳහා යොදාගත හැකි මාර්ග දෙකක් නම් කරන්න. (මුළු ලකුණු 08යි)

## II කොටස - ගිණුම්කරනය

- **ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.**

05. 1. අ) ගිණුම්කරණයේ අරමුණ දෙකක් දක්වන්න.
   ආ) ව්‍යාපාරයක ආදායම් යන්න පැහැදිළි කරන්න. (ලකුණු 02යි)

2. දිල්හාරගේ ව්‍යාපාරයේ 2018 ජනවාරි මස සිදුවූ ගනුදෙනු කීපයක් සමීකරණයට බලපා ඇති ආකාරය පහත දක්වා ඇත.

| | වත්කම් | | | | | = | හිමිකම් | + | වගකීම් | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | මෝටර්රථ | + | තොගය | + | මුදල් | = | | + | බැංකු ණය | + | ණයහිමි |
| ශේෂය | 400,000 | + | 100,000 | + | 50,000 | = | 400,000 | + | 100,000 | + | 50,000 |
| 1. | | | | - | 12,000 | = | - 2000 | - | 10,000 | | |
| 2. | | - | 50,000 | + | 70,000 | = | + 20,000 | | | | |
| 3. | + 100,000 | | | | | = | +100,000 | | | | |
| 4. | | | | - | 10,000 | = | - 10,000 | | | | |

අයිතිකරු විසින් ජනවාරි මාසයේ ගැනිළි සිදුකර නොමැත.

* සිදුවූ එක් එක් ගනුදෙනු විස්තර කරන්න. (ලකුණු 04යි)

3. ව්‍යාපාරයක 2018 ජනවාරි මාය තුල ගනුදෙනු වලට අදාළ බැංකු ගිණුම පහත දැක්වේ.

බැංකු ගිණුම

| දිනය | ල අං | විස්තරය | ස ප්‍ර | වට්ටම් | මුදල | දිනය | ව අං | විස්තරය | ස ප්‍ර | වට්ටම් | මුදල |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2018 | | | | | | 2018 | | | | | |
| 1.1 | | ඉ/ගේ ශේෂය | | | 80,000 | 1/4 | | ආෂිනි (ණයහිමි) | | 1,400 | 28,600 |
| 1.8 | | චමෝද් (ණයගැති) | | 500 | 9,500 | 1/7 | | ගැනුම් | | | 24,000 |
| 1.15 | | ලැබු කොමිස් | | | 2,000 | 1/11 | | ප්‍රසාද් (ණය) | | 200 | 2,800 |
| 1.18 | | හංසනී (ණයගැති) | | 1500 | 13,500 | | | ගැනිලි | | | 1,000 |
| 1.26 | | මුදල් තැන්පත් | | | 40,000 | | | ශේෂය ප/ශේ | | | 87,600 |
| | | | | 2000 | 145,000 | | | | | 1,600 | 145,000 |

1. 2018.01.01 ණයගැති ශේෂයන්

චමෝද් 23,000
හංසනී 20,000

2. 2018.01.01 ණයහිමි

ආෂිනි 25,000
ප්‍රසාදි 6,000

3. ජනවාරි මස ණයට විකුණුම්,

චමෝද් 8,000

හංසනී 5,000

4. ජනවාරි මස ණයට ගැනුම්

ආෂිනි 18,000

ප්‍රසාදි 4,000

අවශ්‍ය වන්නේ,

1. ණයගැති ගිනුම්
2. ණයහිමි ගිණුම්
3. දුන්වට්ටම් ගිණුම්
4. ලැබුවට්ටම් ගිණුම් (ලකුණු 06යි)

06. 1. අ) පොදුජනලයේ සටහන් කරන ගනුදෙනු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 01යි)

ආ) බැංකු අයිරාවක් යනු කුමක්ද? (ලකුණු 01යි)

2. අරුණිගේ ව්‍යාපාරයේ 2018 මාර්තු මාසය සඳහා පිළියෙල කල බැංකුගිණුමේ ශේෂය 23,600 ක් වූ අතර බැංකුප්‍රකාශයේ ශේෂය ඊට වෙනස්විය. වෙනසට හේතු පහත පරිදිවිය.

* නිකුත්කල ගෙවීම සඳහා ඉදිරිපත් නොවු චෙක් 16,000/-
* බැංකුව අයකල බැංකුගාස්තු රු. 1,800/- හා ස්ථාවර නියෝග අනුව බැංකුව ගෙවු රක්‍ෂණය රු. 4,000/-
* ණයගැති සෘජුප්‍රේෂණ රු. 17,000/-
* තැන්පත් කල උපලබ්දි නොවු චෙක් රු. 9,000/-

අවශ්‍ය වන්නේ,

අ) සංශෝධිත බැංකු ගිණුම

ආ) 2018.03.31 දිනට බැංකු සැලසුම් ප්‍රකාශය (ලකුණු 04යි)

3. අත්බෑග් නිෂ්පාදන කිරීමේ ව්‍යාපාරයක් කරගෙන යනුලබන ව්‍යාපාරයේ වියදම් පහත වේ.

| | | |
|---|---|---|
| සම්මිලට ගැනුම් | 45,000 | |
| සිප් හා අනෙකුත් ද්‍රව්‍ය | 2,000 | |
| අත්බෑග් නිපදවන්නාගේ වැටුප | | 7,000 |
| කම්හල් ගොඩනැගිලි කුලී | 10,000 | |
| කම්හල් විදුලිය | | 2,000 |

අවශ්‍ය වන්නේ,

අ) ප්‍රාථමික පිරිවැය

ආ) නිෂ්පාදන පිරිවැය (ලකුණු 02යි)

4. ගුණරත්නගේ ව්‍යාපාරයේ 2017.12.31 දිනට පිළියෙල කල ශේෂ පිරික්සුමේ එකතුව සමනොවු අතර එහිවෙනස රු. 38,000/- ක් අවිනිශ්චිත ගිනුමට බැරකරන ලදී. ගිනුම්පොත් පරීක්‍ෂා කිරීමේදී පහත වැරදි අනාවරණය විය.

A - රු. 8000/- විදුලිබිල ගෙවීම සටහන්ව ඇත්තේ මුදල් පොතේ පමණි.

B - විකුණුම් ගිණුමේ ශේෂය රු. 36000/- ශේෂ පිරික්සුමේ සටහන්ව නොතිබීම.

C - ණයගැති පාරමීගෙන් ලද රු. 5000/- පාරමීන් ගිනුමේ හරට සටහන් කර තිබීම.

අවශ්‍ය වන්නේ,

අ) ඉහත ගනුදෙනු නිවැරදි කිරීමට අදාළ ජ්නල් සටහන්

ආ) අවිනිශ්චිත ගිනුම පිළියල කරන්න. (ලකුණු 04යි)

07. 1. අ) ව්‍යාපාරයක් ෂතවත්කමක ලක්‍ෂක දෙකක් නම් කරන්න.

ආ) ව්‍යාපාරයේ ශුද්ධලාභය ප්‍රාග්ධන ගිනුමට මාරුකිරීමට අදාළ ජ්නල් සටහන ලියන්න. (ලකුණු 01යි)

2. අචිනිගේ නිමිඇඳුම් අලෙවි ව්‍යාපාරයේ 2017 ඔක්තෝම්බර් මාසයට අදාළ ණයට ගැනුම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| දිනය | ඉන්වොයිස් අංක | සැපයුම්කරු | ප්‍රමාණය | අනෙකුත් තොරතුරු |
|---|---|---|---|---|
| 2017.10.12 | 67 | පැහැසරා | එකක් රු. 400/- බැගින් ළමා ඇඳුම් 25 | වෙළඳ වට්ටම 8% |
| 2017.10.28 | 119 | වනසරා | එකක් රු. 275/- බැගින් කොටකලිසම් 20 | වෙළඳ වට්මට 10% |

අවශ්‍ය වන්නේ,

අචිනිගේ ව්‍යාපාරයේ ඔක්තෝම්බර් මාසයේ ගැනුම් ජ්නලය. (ලකුණු 02යි)

3. දසනායක වෙළඳ ව්‍යාපරයේ 2017.12.31 දිනට ශේෂ පිරික්සුම දැක්වේ.

| විස්තරය | හර | බැර |
|---|---|---|
| ප්‍රාශ්ධනය | | 260,000 |
| 2017.01.01 තොගය | 34,000 | |
| ගැනුම් | 380,000 | |
| මෝටර්රථය (පිරිවැයට) | 400,000 | |
| කාර්යාල ලිපකරණ (පිරිවැයට) | 150,000 | |
| 2017.01.01 ක්ෂය වෙන්කිරීම් | | |
| මෝටර්රථ | | 60,000 |
| උපකරණ | | 45,000 |
| සේවක වැටුප් | 16,000 | |
| 10% බැංකු ණය | | 200,000 |
| ගෙනඒමේ කුලී | 10,000 | |
| ණයගැති | 32,000 | |
| ණයහිමි | | 45,000 |
| විදුලිය | 9,600 | |
| ලැබු කොමිස් | | 19,600 |
| ප්‍රචාරණය | 14,000 | |
| ණය පොලී | 8,000 | |
| අතැති මුදල් | 56,000 | |
| විකුණුම් | | 480000 |
| | 1,109,600 | 1,109,600 |

අමතර තොරතුරු

1. 2017.12.31 දිනට ඉතිරි තොගය 74000
2. මෝටර්රථ 5%, උපකරන 10% පිරිවැය මත ක්ෂය කරන්න.
3. බැංකු ණය ලබාගෙන ඇත්තේ 2017.06.30 දිනය (ලකුණු 08යි)

අවශ්‍ය වන්නේ,

(අ) 2017.12.21 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ ලාභ ප්‍රකාශය (ලකුණු 04යි)

(ආ) 2017.12.31 දිනට මුල්‍ය තත්ව ප්‍රකාශය (ලකුණු 04යි)